# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 20 දරන ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1974 ජූනි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1974 ජූලි මස 12 වන දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 20 දරන
# ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1974 ජූනි මස 27 වන දින]

එල්.ඩී.—ඕ. 2/79

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"ශ්‍රී ලංකා පුස්තකාල සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වන රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු කිපය මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථක ව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කිරීම යෝග්‍ය හෙයින් ද :

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 20 දරන ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවෙහි, (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් හැඳින්වෙන) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන් හා එම සංගමයේ සාමාජිකයන් වශයෙන් මින් පසු බඳවා ගනු ලබන තැනැත්තන්, අවිච්ඡින්න පැවැත්මක් ද, පොදු මුද්‍රාවක් ද, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය යන නම ද සහිත (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් හැඳින්වෙන) නීතිගත සංස්ථාවක් විය යුතු ය. ඒ නමින් සංස්ථාව විසින් නඩු පැවරිය හැකි අතර සංස්ථාවට විරුද්ධව ද එසේ නඩු පවරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ සාමාජිකත්වය.

3. (1) පුස්තකාල කාර්යයන්හි නිරත වී සිටින හෝ පුස්තකාල හා ග්‍රන්ථ විද්‍යාත්මක සේවාවන් සලසන හෝ පුස්තකාල, පුස්තකාල සේවාවන් හා පුස්තකාලයාධිපතිත්වය නඟා සිටුවීම පිළිබඳ සැලකිල්ලක් දක්වන පුද්ගලයන්, ආයතන හෝ සමාගම්, සංස්ථාවේ සාමාජිකයන් වීමට සුදුස්සන් විය යුතු ය.

(2) සාමාජිකත්වය පිළිබඳ නියමයන් හා කොන්දේසි සහ සාමාජිකයන් ඇතුළත් කරගැනීම හා ලියා පදිංචි කිරීම සංස්ථාවේ රීතිවලින් නිශ්චය කෙරේ.

සංස්ථාවේ පරමාර්ථ.

4. සංස්ථාවේ පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු ය :—

(අ) ශ්‍රී ලංකාවෙහි පුස්තකාල සේවා පිහිටුවීම, ව්‍යාප්ත කිරීම හා දියුණු කිරීම සහ වෘත්තීය ප්‍රමිතීන් ස්ථාපනය කිරීම;

(ආ) ග්‍රන්ථ විද්‍යාත්මක ප්‍රශ්න හා පුස්තකාලවලට බලපාන කරුණු සාකච්ඡා කිරීම සඳහා සම්මේලන හා රැස්වීම් පැවැත්වීමෙන් පුස්තකාල කටයුතුවල නිරත වූ හෝ ඒවා කෙරෙහි උනන්දුවක් දක්වන සියල්ලන් එක් කිරීම;

1—ඒ 00181—8,914 (73/07)

(ඇ) පුස්තකාලයාධිපති වෘත්තියෙහි යෙදී සිටින සාමාජිකයන්ගේ යහපත, ශුභසිද්ධිය, අයිතිවාසිකම් හා වරප්‍රසාද ආරක්ෂා කිරීම සහ වර්ධනය කිරීම ;

(ඈ) පුස්තකාලයාධිපතිවරුන් පුහුණු කිරීම හා පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ වෘත්තිය විභාග පවත්වා ප්‍රවීණත්වය පිළිබඳ සහතික නිකුත් කිරීම ;

(ඉ) ශ්‍රී ලංකාවෙහි පුස්තකාල අතර වඩාත් කිට්ටු සමායෝජනය හා සහයෝගය වර්ධනය කිරීම ;

(ඊ) ග්‍රන්ථ විද්‍යාව පිළිබඳ අධ්‍යයන හා පර්යේෂණ ද වෘත්තීය පොත්පත් පළ කිරීම ද වර්ධනය කිරීම සහ ඒවාට ධෛර්යදීම ;

(උ) වෘත්තීය පොත්පත් එකතු කොට පුස්තකාලයක් පවත්වා ගෙන යාම ;

(ඌ) ශ්‍රී ලංකාව තුළ හා ඉන් බැහැර අධ්‍යාපනය හා සංස්කෘතිය වර්ධනය කිරීමෙහි ලා උනන්දුවක් දක්වන පුස්තකාල සංගම් හා අන් සංවිධාන සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම ; සහ

(එ) ඉහත සඳහන් පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට ආනුෂංගික වූ හෝ හිත කර වූ අන් සියලු දේ කිරීම.

පාලක සභාව.

5. (1) සංස්ථාවේ පාලක මණ්ඩලය එහි පාලක සභාව විය යුතු ය.

(2) පාලක සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) සංස්ථාවේ රීතිවලට අනුකූල ව වාර්ෂික මහා සභා රැස්වීමේ දී සංස්ථාවේ සාමාජිකයන් අතුරින් තෝරා පත් කර ගත යුතු මෙහි පහත නිශ්චිතව සඳහන් කරනු ලබන සංස්ථාවේ නිලධාරීන්, එනම් :—

(i) සභාපති

(ii) උපසභාපතිවරු දෙදෙනා

(iii) ප්‍රධාන ලේකම්

(iv) උප ප්‍රධාන ලේකම්

(v) භාණ්ඩාගාරික

(vi) අධ්‍යාපන නිලධරයා

(vii) ප්‍රකාශන නිලධරයා.

(ආ) අන්තිමට සභාපතිව සිටි සාමාජිකයා.

(ඇ) අන් සාමාජිකයන් :—

(i) සංස්ථාවේ රීති අනුව සංස්ථාවේ එක් එක් වෘත්තීය කණ්ඩායමකින් තෝරා පත් කර ගත් නියෝජිතයකු ;

(ii) සංස්ථාවේ රීති අනුව සංස්ථාවේ එක් එක් ප්‍රාදේශීය ශාඛාවකින් තෝරා පත් කර ගත් නියෝජිතයකු ; හා

(iii) සංස්ථාවේ සාමාජිකයන් අතුරෙන් පාලක සභාව විසින් තෝරා පත් කර ගත යුතු අන් සාමාජිකයන් දෙදෙනකු.

(3) පාලක සභා රැස්වීමක ගණපූරණය පාලක සභාව විසින් නිශ්චය කළ යුතු ය.

(4) මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී ධුර දරන පාලක සභාවේ සාමාජිකයන් පාලක සභාවේ පළමු සාමාජිකයන් විය යුතු අතර සංස්ථාවේ ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීම තෙක් ධුර දැරිය යුතු ය.

(5) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි නිශ්චිතව සඳහන් කරන ලද පාලක සභා සාමාජිකයන්ගේ නිල කාලය සංස්ථාවේ රීතිවලින් නිශ්චය කෙරේ.

6. (1) මේ පනතේ විධිවිධානවලට හා සංස්ථාවේ රීතිවලට යටත්ව පාලක සභාවට පහත සඳහන් බලතල හා යුතුකම් තිබිය යුතු ය:— පාලක සභාවේ බලතල හා යුතුකම්.

(අ) අවශ්‍ය යැයි පාලක සභාව සලකන ස්ථාවර කමිටු හා අන් කමිටු සංස්ථාපනය කිරීම ;

(ආ) රීති සෑදීම සම්බන්ධයෙන් ද පවත්නා රීතිවලට එකතු කිරීම්, ඒවා වෙනස් කිරීම්, සංශෝධනය කිරීම් හා ඒවා පරිච්ඡින්න කිරීම් සම්බන්ධයෙන් ද සංස්ථාව වෙත නිර්දේශ කිරීම ;

(ඇ) සංස්ථාවේ පොදු මුද්‍රාව නිශ්චය කිරීම හා අවශ්‍ය වූ විටෙක එය වෙනස් කිරීම ;

(ඈ) සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා මුදල් ඇස්තමේන්තු සලකා බලා අවශ්‍ය පරිදි සංශෝධන සහිත ව පිළිගැනීම ;

(ඉ) සංස්ථාවේ විශේෂ හා වාර්ෂික මහා සභා රැස්වීම් කැඳවීම ;

(ඊ) සංස්ථාවේ අධිසාමාජිකත්ව හා සංගමිකත්ව ප්‍රදානය කිරීම ;

(උ) සංස්ථාවේ යහපතට අමයෝග්‍ය හා හානිකර වූ පැවැත්ම නිසා විධායක කමිටුවේ නිර්දේශය පිට සංස්ථාවේ සාමාජිකත්වයෙන් යම් සාමාජිකයකු නෙරපීම හා සංස්ථාව විසින් ඒ සාමාජිකයාට ප්‍රදානය කරන ලද යම් අධිසාමාජිකත්වයක් හෝ සංගමිකත්වයක් ඉල්ලා අස් කර ගැනීම ;

(ඌ) සංස්ථාවේ වේතනාර්හ නිලධරයන්ගේ හා සේවකයන්ගේ තනතුරු ඇති කොට ඔවුන්ට ගෙවිය යුතු පඩිනඩි නිශ්චය කිරීම හා ඔවුන්ගේ සේවා නියමයන් හා කොන්දේසි නිශ්චය කිරීම ;

(එ) ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම හා ඒ කාර්යය සඳහා විශේෂ අරමුදල් ඇති කිරීම ;

(ඒ) පෞද්ගලික ආයතන විසින් පිහිටුවන ලද හෝ පවත්වා ගෙන යනු ලබන පුස්තකාල පාඨශාලා හෝ පාඨමාලා සංස්ථාවේ අධ්‍යාපන කටයුතු සඳහා පිළිගැනීම හා අනුමත කිරීම ;

(ඔ) පෞද්ගලික ආයතන මඟින් ප්‍රතිෂ්ඨාපනය කරන ලද හෝ පවත්වාගෙන යනු ලබන පුස්තකාල පාඨශාලා, පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පාඨමාලා සහ පරීක්ෂණ පිළිගැනීම හා අනුමත කිරීම සම්බන්ධයෙන් ද පුස්තකාලයාධිපති වෘත්තිය පිළිබඳ වෙනත් කවර හෝ කරුණක් සම්බන්ධයෙන් ද යම් තැනැත්තකුට හෝ ආයතනයකට උපදෙස් දීම;

(ඕ) පරීක්ෂකයන්ට, කථිකාචාර්යවරුන්ට හා සංස්ථාව සඳහා පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ තැපැල් පාඨමාලා සකස් කරන තැනැත්තන්ට සංස්ථාව විසින් ගෙවිය යුතු ගාස්තු නිශ්චය කිරීම;

(ක) සංස්ථාවට ගෙවිය යුතු වූ සාමාජික මුදල්, ඉගැන්වීමේ හා පරීක්ෂණ ගාස්තු හා අනෙක් ගාස්තු නිශ්චය කිරීම;

(ග) සංස්ථාවේ වෘත්තිය කණ්ඩායම් හා ප්‍රාදේශීය ශාඛා පිහිටුවීම, පිළිගැනීම හා ලේඛනාරූඪ කිරීම; හා

(ච) මේ පනතින් හෝ සංස්ථාවේ රීතිවලින් පාලක සභාව වෙත බලය පවරන ලද හෝ නියම කරන ලද අන් ක්‍රියාවක් හෝ යුතුකමක් කිරීම හෝ ඉටු කිරීම.

(2) පාලක සභාවේ සංයුතියෙහි තත් කාලයෙහි යම් පුරප්පාඩුවක් තිබුන ද සියලු අයිතිවාසිකම් පාවිච්චි කිරීමට හා සියලු යුතුකම් ඉටු කිරීමට පාලක සභාවට බලය තිබිය යුතු ය.

විධායක කමිටුව.

7. (1) සංස්ථාවේ ප්‍රධාන විධායක මණ්ඩලය විධායක කමිටුව විය යුතු ය.

(2) විධායක කමිටුව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) මෙහි පහත නිශ්චිතව දැක්වෙන නිලධරයන්:—

(i) සභාපති

(ii) උපසභාපතිවරු දෙදෙනා

(iii) ප්‍රධාන ලේකම්

(iv) උප ප්‍රධාන ලේකම්

(v) භාණ්ඩාගාරික

(vi) අධ්‍යාපන නිලධරයා

(vii) ප්‍රකාශන නිලධරයා.

(ආ) පාලක සභාව විසින් එහි සාමාජිකයන් අතරින් තෝරා පත් කර ගත යුතු අන් සාමාජිකයන් සිව් දෙනකු.

(3) විධායක කමිටුවේ රැස්වීමක ගණපූරණය පාලක සභාව විසින් නිශ්චය කළ යුතු ය.

විධායක කමිටුවේ බලතල හා යුතුකම්.

8. (1) මේ පනතේ විධිවිධානවලට හා සංස්ථාවේ රීතිවලට යටත්ව ද පාලක සභාවේ විධානය හා පාලනයට යටත්ව ද විධායක කමිටුවට පහත සඳහන් බලතල හා යුතුකම් තිබිය යුතු ය:—

(අ) සංස්ථාවේ දේපළ හා අරමුදල් මිලට ගැනීම, ඇරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම;

(ආ) සංස්ථාවේ පොදු මුද්‍රාවේ ආරක්ෂාව සඳහා විධිවිධාන සැලැස්වීම හා ඒ මුද්‍රාවේ පාවිච්චිය සම්බන්ධයෙන් විධාන කිරීම ;

(ඇ) සංස්ථාවේ වේතනාර්හ නිලධරයන් හා අන් සේවකයන් පත් කිරීම, උසස් කිරීම, අත්හිටුවීම, පහ කිරීම හා ඔවුන්ට අන් ආකාරයකින් දඬුවම් කිරීම ;

(ඈ) සංස්ථාවට දෙනු ලබන යම් මුදල් හෝ දේපල පිළිබඳ අන්තිම කැමති පත්‍ර, පරිත්‍යාග හා ප්‍රදාන ලැබීම, පිළිගැනීම හා පරිපාලනය කිරීම ;

(ඉ) සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා මුදල් ඇස්තමේන්තු පිළියෙල කොට සලකා බැලීම හා ඒ වාර්තාව හා ඇස්තමේන්තු පාලක සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(ඊ) සංස්ථාවේ හෝ එහි යම් කමිටුවල හෝ නියෝජිත මණ්ඩලවල කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය වන ගොඩනැගිලි, ස්ථාන, දැව භාණ්ඩ හා උපකරණ ද සෙසු පහසුකම් ද සැපයීම ;

(උ) සංස්ථාව වෙනුවෙන් ගිවිසුම්වලට ඇතුළුවීම, ඒවා වෙනස් කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ අවලංගු කිරීම ;

(ඌ) සංස්ථාවේ පරමාර්ථ වර්ධනය කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා සම්මේලන හා සම්මේලන කැඳවීම හා සංවිධානය කිරීම හෝ ඒ සාකච්ඡා සම්මේලන හා සම්මේලන පැවැත්වීම සම්බන්ධයෙන් රීති සෑදීම ;

(එ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය හා ප්‍රයෝජනවත් යැයි සැලකෙන ප්‍රදර්ශන, දේශන හා එවැනි වෙනත් කාර්යයන් සංවිධානය කිරීම ;

(ඒ) නව සාමාජිකයන් ඇතුළත් කරගැනීම හා ලියාපදිංචි කිරීම ;

(ඔ) සාමාජික මුදල් නොගෙවීම නිසා හෝ සංස්ථාවේ යහපතට අමනෝඥ හා හානිකර වූ යම් පැවැත්මක් නිසා සංස්ථාවේ සාමාජිකත්වයෙන් සාමාජිකයන් අත්හිටුවීම හා ඔවුන් නෙරපීම සඳහා පාලක සභාවට නිර්දේශ කිරීම ;

(ඕ) ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ; හා

(ක) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා හිතකර වන අන් සියලු බලතල පාවිච්චි කිරීම හා අන් සියලු යුතුකම් ඉටු කිරීම.

(2) විධායක කමිටුවේ සංයුතියෙහි තත් කාලයෙහි යම් පුරප්පාඩුවක් තිබුන ද සියලු බලතල පාවිච්චි කිරීමට හා සියලු යුතුකම් ඉටු කිරීමට ඒ කමිටුවට බලය තිබිය යුතු ය.

2—ඒ 00181—(73/07)

සංගමය විසින් හෝ සංගමයට ගෙවිය යුතු මුදල් සංස්ථාව විසින් හෝ සංස්ථාවට ගෙවිය හැකි බව.

**9.** මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේදී සංගමයෙහි පවත්නා සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර සංගමයට අය විය යුතු සියලු ණය සහ සංගමයට ගෙවිය යුතු සියලු සාමාජික මුදල්, දායක මුදල් හා දඩ මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් දේපල අත්කර ගැනීම, දැරීම හා බැහැර කිරීම සහ මුදල් ණයට ගැනීම කළ හැකිබව.

**10.** සංස්ථාව විසින්,—

(අ) මිලට ගැනීමේ, ප්‍රදානය කරනු ලැබීමේ, ත්‍යාග වශයෙන් ලැබීමේ, නැතහොත් අන්තිම කැමති පත්‍රයකින් දේපල බැහැර කිරීමේ අයිතිවාසිකමක් අනුව හෝ අන් ආකාරයකින් යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීම හා දැරීම කළ හැකි ය;

(ආ) සංස්ථාවේ තත් කාලයෙහි පවත්නා රීතිවලට යටත් ව, යම් දේපලක් දැරිය යුතු ය;

(ඇ) සවකීය දේපලවලින් යමක් විකිණීම, උකස් කිරීම, බදු දීම, මාරු කිරීම හෝ අන් ආකාරයකින් බැහැර කිරීම කළ හැකි ය; එමෙන් ම

(ඈ) සංස්ථාවේ කාර්යයන් සඳහා මුදල් ණයට ගත හැකි ය.

රීති.

**11.** (1) පාලක සභාවේ රැස්වීමකදී ඒ පාලක සභාවේ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් වූ පූර්ව අනුමතිය ඇතිව යම් මහා සභා රැස්වීමකදී ඒ රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය සඳහා සහ එහි පරමාර්ථ සපුරාලීම සඳහා කලින් කල සංස්ථාව විසින් රීති සෑදීම නීත්‍යනුකූල විය යුතු ය. ඒ රීති සාදනු ලැබූ විට ඒ හා සමාන ආකාරයෙන් ම ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාව විසින් රීති සාදනු ලබන තෙක් සංගමය විසින් සාදනු ලැබ මේ පනත ක්‍රියාත්මක වන දිනයෙහි බල පවත්නා නියෝග සංස්ථාව විසින් සාදනු ලැබූ රීති වශයෙන් සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු අතර අඛණ්ඩ ව බල පැවැත්විය යුතුවාක් හැර මේ පනත යටතේ සාදනු ලබන රීතිවලින් ඒවා සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

ජනරජයේ හා අනායන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12.** මේ පනතේ සඳහන් ආයතන කෙරෙහි හා ඒවා මගින්, ඒවායේ හෝ ඒවා යටතේ හිමිකම් පාන ආයතන කෙරෙහි හැර, ජනරජයේ හෝ දේශපාලන හෝ නීතිගත මණ්ඩලයක හෝ අන් කිසි තැනැත්තකුගේ අයිතිවාසිකම් කෙරෙහි මේ පනතේ අන්තර්ගත කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතුය.